# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම - 05 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

### වාචික කොටස

1. පින්කම් කියන්නේ මොනවාද?
2. අපට කළ හැකි පින්කම් මොනවාද?
3. **පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි** යන බණ පදයේ තේරුම කුමක් ද?
4. එම බණ පදය සහිත පුවරුව එල්ලා තිබුණේ කොහෙද
5. අපිට ලැබෙන සැප අවස්ථා කිහිපයක් කියන්න.
6. අපිට තරමක් හරි සැප ලැබෙන්නේ කුමක් නිසාද්?.
7. සැප ලැබෙන්න පින්කම් කරන්න යන පාඩමට අනුව යන පාඩමට අනුව නිවසේ දී කළ හැකි පින්කම් මොනවාද?
8. ඔබ මේ දිනවල දී නිවසේ සිට කළ පින්කම් කීපයක් කියන්න.
9. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමට අපට කළ හැකි දේවල් තුනක් කියන්න.
10. පුංචි ඔබට දෙමාපියන්ට උදව් විය හැකි ආකාරය කියන්න.

### ලිඛිත කොටස

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. ස්වාමීන් වහන්සේ පාසල් ළමයින්ට අනුශාසනාවක් කළේය . ( )
2. උන්වහන්සේට ස්වාමීන්වහන්සේට දානය පූජා කිරීම පින් ලැබෙන කටයුත්තකි ( )
3. නරක වචන කතා නොකිරීම පින් ලැබෙන කටයුත්තක් නොවේ . ( )
4. තමන්ට නුදුන් දෙයක් සොර සිතින් ගැනීමය පින් ලැබෙන කටයුත්තකි ( )
5. ලෙඩ රෝග නොමැතිව සිටීමය ලැබීම සැපතකි ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. සිසුන් පෝය දිනයේ දී ................සමාදන් විය. (අට සිල්/ දස සිල් )
2. පන්සලේ දී අපි මුලින්ම වඳින්නේ ............. ය (බෝ මළුව / සෑ මළුව)
3. භාවනාව සඳහා ...................තබාගත යුතුය. (වම් අත මත දකුණත /දකුණත මත වම් අත)
4. යාචකයෙකුට ඇඳුම් ලබා දීම................දෙන දානයකි (පූජා බුද්ධියෙන්/ අනුග්‍රහ බුද්ධියෙන් )
5. ................අපට කුඩුවක් තනා දිය හැකිය. (ලේනන්ට /බල්ලන්ට)